# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,639—1959 ජනවාරි 12 වැනි සඳුදා—12.1.59

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

අංක එච් 25 දරණ ආහාර මිල නියෝගය.

සහල්

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක තැන්පත් කම්බයියා සිවඥනම් වන මම, 3(2) වගන්තිය හා කියවෙන 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1958 ජූනි මස 6 වන දින අංක 11,345 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක එච් 23 හා 1958 මැයි 28 දින දරණ මිල නියෝගය 1959 ජනවාරි 5 දින සිට අවලංගු කරමි.

(ii) 1959 ජනවාරි 5 ද සිට මීට යාකර ඇති 1 වැනි උපලේඛනයේ 2 වන තීරයේ දක්වෙන මිළ, එම උපලේඛනයේම පළමුවන තීරයේ දක් වෙන පෙදෙස්වල සහල් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර, ඒ මිළට වඩා ඒ පෙදෙස්වල නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(iii) 1959 ජනවාරි 5 වන ද සිට මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ 2 වන තීරයේ දක්වෙන මිළ එම උපලේඛනයේම 1 වන තීරයේ දක් වෙන පෙදෙස්වල සහල් සිල්ලරට ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර, ඒ මිළට වඩා ඒ පෙදෙස් වල නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(iv) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) මොනම සහල් ප්‍රමාණයක් වුවත්, යළිත් විකිණීමක් සඳහා වික්ණීමක් වුවහොත්, ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගතයුතු බවත් ;

(ආ) මොනම සහල් ප්‍රමාණයක් වුවත්, පාරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා හෝ විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන්ගත යුතු බවත්;

(ඇ) '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත් ;

(ඈ) සහල් ඕනෑම ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි හෝ වූ විට එම සහල් ප්‍රමාණයට ගෙවිය යුතු වැඩිම මිළ මෙම නියෝගයෙන් නියමකරනු ලැබූ ශුද්ධ බර හොණ්ඩරයක මිළ අනුව ගණන් බලා සකස්කර ගත යුතු බවත් නියෝග කරමි.

(v) වෙන ද්‍රව්‍යයන් සමග මිශ්‍ර කිරීමෙන් බාල කරන ලද සහල් කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(vi) සහල් විකිණීමේදී එම සහල් යම් දෙයක ඔතනු හෝ අසුරනු හෝ ඇතිනම් එහි මිළද මේ නියෝගයෙන් සහල් වලට නියමකරන ලද වැඩිම මිළ බවද නියම කරමි.

(vii) මේ නියෝගයෙන් වැඩිම මිළ නියම කරන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ සහල් තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම මේ නියෝගයෙන් ඒ ප්‍රදේශයට නියම කරන වැඩිම මිළ සඳහන් කරන දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතුබව නියම කරමි.

(viii) සිල්ලර වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම සහ තොග වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම, මිළදී ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් දෑ අඩංගු කුවිතාන්සියක් ඔහුට දියයුතු බව නියෝග කරමි:—

(අ) විකුණූ දිනය,
(ආ) (බර අනුව) විකුණූ ප්‍රමාණය,
(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල, හා
(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද නැති නම් සිල්ලර වශයෙන්ද.

1959 ජනවාරි 6 වන දින පෙරවරු 9.30ට හම්බන්තොටදී අත්සන්කරන ලදී.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය ආහාර මිළ පාලකතැන,
පරිපාලන දිස්ත්‍රික්කය, හම්බන්තොට.

145—ජේ. ඇන්. ආර් 27625—4,425 (1/59)

## පළමුවන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| 1. තංගල්ල ... ... ... ... | 20 44 |
| 2. බෙලිඅත්ත ... ... ... ... | 20 55 |
| 3. මහවෙල ... ... ... ... | 20 71 |
| 4. දෙද්දූවාවල ... ... ... ... | 20 72 |
| 5. වලස්මුල්ල ... ... ... ... | 20 75 |
| 6. වීරකැටිය ... ... ... ... | 20 89 |
| 7. කිරම ... ... ... ... | 20 92 |
| 8. කටුවන ... ... ... ... | 20 98 |
| 9. මිද්දෙනිය ... ... ... ... | 20 83 |
| 10. හම්බන්තොට ... ... ... ... | 21 19 |
| 11. අම්බලන්තොට ... ... ... ... | 20 98 |
| 12. තිස්ස ... ... ... ... | 21 69 |
| 13. රන්න ... ... ... ... | 21 19 |
| 14. ඉහත සඳහන් නොවූ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනික් සෑම ප්‍රදේශයකම | 20 44 |

## දෙවන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය — සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක වැඩිම මිළ<br>(අ)<br>රාත්තලක හෝ ඊට අඩු සියලුම ගනුදෙනු වලට රාත්තලක මිළ<br>ශත | | (ආ)<br>වරකට රාත්තලට වැඩි සියලුම ගනුදෙනුවලට රාත්තල් 2ක මිළ<br>ශත |
|---|---|---|---|
| 1. රැකව, තංගල්ල, උනාකුරුව, වල්ගම්එළිය, මාරකොල්ලිය, තේනගම, කදුරුපොකුණ, පොළොන් මාරුව, සිටිනාමළුව, වගේගොඩ, බෙලිඅත්ත, ගොඩවෙල, කහවත්ත, පුවක්දණ්ඩාව, දම්මුල්ල, ඉහළබෙලිගල්ල, පහළබෙලිගල්ල, පල්ලත්තර, පට්ටියවෙල, සියඹලාගොඩ, වහරක්ගොඩ තාරපේරිය, ගැටමාන්න උතුර, ගැටමාන්න දකුණ, කුඩාහිල්ල, මහහිල්ල සහ පලපොත යන ගම් මුළාදෑනි කෝට්ඨාශය ... ... ... ... | 19 | ... | 38 |
| 2. බෝවල, ගලහිටිය, හොරවෙල, ඉත්තදෙමළිය, කඩිගමුව, තලහගම්වාඩුව, වලස්මුල්ල, දළුවක්ගොඩ, කණුමුල්දෙනිය නැගෙනහිර, කණුමුල්දෙනිය දකුණ, කණුමුල්දෙනිය බටහිර, මොදරවාන, වාව්ව, යටිගල, කුඩාවැල්ල නැගෙනහිර, කුඩාවැල්ල බටහිර, සීනිමෝදර, නාකුළුගමුව බටහිර, නාකුළුගමුව නැගෙනහිර, දෙද්දූවාවල, අම්බල සහ ගලගම යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... | 19 | ... | 38½ |
| 3. බැදිගම, බුද්දියාගම, ගෝනදෙනිය, මන්ඩාඩුව, මූකිරිගල, යක්ගස්මුල්ල, කිංචිගුනේ, හීල්ගෙඅයන, වල්ගම්මුල්ල, වෙළඳගොඩ, රදනිආර, බූකැන්දයාය, හොරවින්න, ජුලම්පිටිය, ගහලන්දෙනිය, කටුවන, රුක්මල්පිටිය, සියාරපිටිය, තල්වත්ත, සහ උඩගොමඩිය යන ගම් මුළාදෑනි කොට්ඨාශ ... | 19½ | ... | 39 |
| 4. හඳුගල, වරාපිටිය, පාතෙගම සහ පිහලැල්ල යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... | 20 | ... | 40½ |
| 5. මිද්දෙනිය, හල්ලල, සපුගහයාය, ලබුහේන්ගොඩ, මෙල්ලකැටිගොඩ, මුරුන්ගස්යාය, වැලිපිටිය, කුඩාගල්ආර, කුඩාගොඩ, තලාව, දෙබොක්කාව, දබරැල්ල සහ ඕකන්දෙයාය යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 19 | ... | 38½ |
| 6. අබේසේකරගම, උස්වැව සහ සියඹලාකොටෙ යන ගම්මුළාදෑනි කොට්ඨාශය ... ... | 19½ | ... | 39 |
| 7. වැලිපටන්විල, මිණිඇතිලිය, මාමඩල, තව්ාලුවිල, ලුනම, බැමිණියන්විල, හාතගල, වාදුරුප්ප, බෝලාන, බැරගම, වලවෙ, ඇත්බටුව, බටඅත, පල්ලෙගම, අඟුණුකොළපැලැස්ස, මුලන සහ කොග්ගල්ල යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... | 19½ | ... | 39 |
| 8. හම්බන්තොට නගර සභා කොට්ඨාශය ... ... ... ... | 19½ | ... | 39 |
| 9. බුන්දල, ගොන්නෝරුව, කොහොලන්කල, ඉහළකුඹුක්වැව සහ වැලිවැව යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 20 | ... | 40 |
| 10. රනකෙලිය දකුණ, රනකෙලිය උතුර, උඩුවිල, තිස්ස උතුර, තිස්ස දකුණ සහ වීරවිල යන ගම් මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 20 | ... | 40 |
| 11. මත්තල සහ අඟුණකොළවැව යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... | 20½ | ... | 41 |
| 12. කිරින්ද සහ මාගම යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... | 20 | ... | 40½ |
| 13. ජුලමුල්ල, පට්ටියපොල, උඩයාල, හීන්බුත්න, දහඅමුණ, හකුරුවෙල, මැදගොඩ, විතාරන්දෙනිය සහ වකමුල්ල යන ගම් මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... | 19½ | ... | 39½ |
| 14. ගුරුපොකුණ, නෙටොල්පිටිය, විගමුව සහ කහඳාමෝදර යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... | 19½ | ... | 39 |

සැළකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් සහල් විකිණීමෙ නියමිත මිළ නොවේ. මෙ එම සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. මෙ මිළ ගණන්වලට ඉහළින් සහල් විකිණිය නොහැකිය.

අංක : ඇන්/ඊ 43 දරණ මිළ නියෝගය

කරවල සහ වියලි ඉස්සෝ

## 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

නුවර එළිය දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ආතර් කත්බට් බතෝලමියුස් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් හා 3(2) යන වගන්තියෙන් ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,460 සහ 1958 ජුලි 28 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද අංක ඇන්/ඊ 37 සහ 1958 ජුලි 23 වෙනි දින දරණ මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති " ඒ " උප ලේඛණයේ 2 වැනි තීරයේ සිට 18 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් සඳහන් කර ඇති ද්‍රව්‍යයන් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොන්ඩරයක්, එම උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිළ එම උප ලේඛණයේ 2වැනි තීරයේ සිට 18 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) මීට යාකර ඇති " බි " උපලේඛණයේ 2 වෙනි තීරයේ සිට 13 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් සඳහන් කර ඇති ද්‍රව්‍යයන් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක්, එම උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිළ එම උප ලේඛණයේ 2 වැනි තීරයේ සිට 13 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද මේ නියෝගයේ කාය්‍යීය සඳහා—

(අ) කරවල හෝ වියලි ඉස්සන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වියලි ඉස්සන් හෝ කරවල වරකට ශුද්ධ බර හොන්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) කරවල හෝ වියලි ඉස්සන් නැවත විකිණීම සඳහා හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා ශුද්ධ බර හොන්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) කරවල හෝ වියලි ඉස්සන් තොග වශයෙන් විකිණීමට පුරුදුව සිටින කවරකු හෝ තොග වෙළෙන්දෙකු ලෙස සලකන බවත්,

(ඈ) මීට යාකර ඇති " ඒ " උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ විකිණීම සඳහා නියමිත " තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ දී වැඩිම මිළ " සියළුම තොග වශයෙන් විකිණීම වලදී බල පවත්වන බවත්,

(ඉ) " සිල්ලර වශයෙන් විකිණීමේ දී වැඩිම මිළ " සියළුම සිල්ලර වශයෙන් විකිණීම සඳහා බලපවත්වන බවත්,

(ඊ) " වේලන ලද මාළු " සහ " කරවල " එකසේ සලකන බවත්,

(5) මීට යාකර ඇති " ඒ " සහ " බී " උපලේඛණයන්හි 2 වැනි තීරයේ සිට 18 වැනි තීරය සහ 2 වැනි තීරයේ සිට 13 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් වර්ගකර ඇති කරවල සහ වියලි ඉස්සන් වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාල කිරීමෙන් කිසිම කෙනෙකු විසින් මෙම නියෝගයෙන් නියම කරනු ලබන සීමාවන් තුළ නොවිකිණිය යුතු බවත්,

(6) තවද මෙම නියෝගයෙන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම, මීට යාකර ඇති " ඒ " සහ " බී " උපලේඛණයන්හි 2 වැනි තීරයේ සිට 18 වැනි තීරයේ හා 2 වැනි තීරයේ සිට 13 වැනි තීරය දක්වා අනුපිළිවෙළින් වර්ගකර ඇති කරවල හෝ වියලි ඉස්සන් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ යම් ස්ථානයක හෝ වාහනයක තබාගෙන සිටින සෑම වෙළෙන්දකු විසින්ම, මෙම නියෝගයෙන්, ඒ ඒ වර්ගය සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත්,

(7) තවද මෙම නියෝගයේ කාය්‍යීය සඳහා " රාත්තල " හෝ " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත්,

(8) තවද මෙම නියෝගයෙන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මීට යාකර ඇති " ඒ " සහ " බී " උපලේඛණයන්හි 2 වැනි තීරයේ සිට 18 වැනි තීරයේ සහ 2 වැනි තීරයේ සිට 13 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් වර්ගකර ඇති කරවල සහ වියලි ඉස්සන් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම, මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,
(ආ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර :
(ඇ) විකුණූ ප්‍රමාණය (දළ බර සහ ශුද්ධ බර) :
(ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල :
(ඉ) වෙළඳාමේ සවභාවය එනම්, වෙළඳාම තොග වශයෙන් ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත්, කුවිතාන්සියක් මිළදී ගන්නාට දිය යුතු බව මෙයින් නියම කරමි.

(9) තවද මීට යාකර ඇති " ඒ " සහ " බී " උපලේඛණයන්හි 2 වැනි තීරයේ සිට 18 වැනි තීරය සහ 2 වැනි තීරයේ සිට 13 වැනි තීරය දක්වා අනුපිළිවෙලින් වර්ගකර ඇති ද්‍රව්‍ය විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේනම් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනු ලබන වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(10) තවද, කුම්බලා, බොම්බිලි හාල්මැස්සන් සහ වියලි ඉස්සන් හැර මීට යාකර ඇති " ඒ " සහ " බී " උපලේඛණයන්හි පිළිවෙලින් 2වෙනි තීරයේ සිට 18 වෙනි තීරය දක්වා ද, 2 වෙනි තීරයේ සිට 13 වෙනි තීරය දක්වා ද සඳහන් වෙනත් කරවල කිසිවෙක බහා විකුණන විට එම කරවල බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් දහය බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(11) " ඒ " සහ " බී " උපලේඛණයන්හි පිළිවෙලින් 14 හා 9 වෙනි තීරයන්හි සඳහන් කුම්බලාවන් කිසිවක බහා විකුණන විට, ඒ බහා ඇති එකී භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විසිපහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(12) " ඒ " සහ " බී " උපලේඛණයන්හි පිළිවෙලින් 15 හා 10 වෙනි තීරයන්හි සඳහන් බොම්බිලි කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එකී භාණ්ඩය සඳහා, දළ බරින් තාර බර ලෙස අඩු වශයෙන් රාත්තල් අට බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවත්,

(13) " ඒ " සහ " බී " උපලේඛණයන්හි පිළිවෙලින් 16 හා 11 වෙනි තීරයන්හි සඳහන් හාල්මැස්සන් කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එකී භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විස්ස බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(14) " ඒ " සහ " බී " උපලේඛණයන්හි පිළිවෙලින් 17 සහ 18 යන තීරයන්හිද, 12 සහ 13 යන තීරයන්හි ද සඳහන් වියලි ඉස්සන් ලෙලි රහිතව හෝ සහිතව කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් පහලොව බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(15) මෙම නියෝගය සඳහා " ශුද්ධ " යන්නෙන් හැඟවෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ කරවල නැතහොත් වියලි ඉස්සන්ගේ බර පමණක් බවද නියම කරමි.

1958 ජනවාරි 9 වෙනි දින, පෙ. ව. 11 ට නුවරඑළියේ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ආතර් කත්බට් බතෝලමියුස්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය "ඒ"

### තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිල

| තීරය 1 ප්‍රදේශය | 2 හිස රහිත තෝර | 3 හිස සහිත තෝර | 4 හිස රහිත කට්ට | 5 හිස සහිත කට්ට | 6 හිස සහිත අන්ජිලා | 7 හිස රහිත අන්ජිලා | 8 හිස රහිත පරවු | 9 හිස සහිත පරවු | 10 හිස රහිත කොඩුවා | 11 හිස සහිත කොඩුවා | 12 බලයා | 13 තොන්ඩ | 14 කුම්බලා | 15 බොඑ බිලි | 16 හැල්මැස්සෝ | 17 වියලි ලෙලි රහිත ඉස්සෝ | 18 වියලි ලෙලි සහිත ඉස්සෝ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නුවරඑළිය නාගරික සභා ප්‍රදේශය ... | | | | | | | | | | | | | | | | | |
| 2. කඳපොල ... ... | | | | | | | | | | | | | | | | | |
| 3. නානුඔය ... ... | | | | | | | | | | | | | | | | | |
| 4. රම්බොඩ වවුම ... ... | | | | | | | | | | | | | | | | | |
| 5. සංගිලිපාලම ... ... | | | | | | | | | | | | | | | | | |
| 6. කුඩාඔය ... ... | | | | | | | | | | | | | | | | | |
| 7. පුන්ඩළුඔය ... ... | 121 14... | 101 74... | 89 15... | 68 17... | 61 88... | 66 08... | 99 64... | 80 76... | 89 15... | 64 83... | 89 15... | 68 17... | 28 84... | 80 76... | 76 56... | 121 09... | 95 44 |
| 8. තිස්පනේ කෝරලේ ... ... | | | | | | | | | | | | | | | | | |
| 9. පල්ලෙපනේ කෝරලේ ... | | | | | | | | | | | | | | | | | |
| 10. මොරපේ ... ... | | | | | | | | | | | | | | | | | |
| 11. වලිකුල්වු ... ... | | | | | | | | | | | | | | | | | |
| 12. දියගම ... ... | | | | | | | | | | | | | | | | | |
| 13. ආගරපතන ... ... | | | | | | | | | | | | | | | | | |
| 14. මැදපනේ ගම්සභා ප්‍රදේශය ... | | | | | | | | | | | | | | | | | |
| 15. රාගල ... ... ... | 121 67... | 102 18... | 89 54... | 68 47... | 62 15... | 66 36... | 100 07... | 81 11... | 89 54... | 65 11... | 89 54... | 68 47... | 28 97... | 81 11... | 76 90... | 121 67... | 95 86 |
| 16. උඩපුස්සැල්ලාව ... ... | | | | | | | | | | | | | | | | | |
| 17. නිල්දණ්ඩාහින්න ... ... | | | | | | | | | | | | | | | | | |
| 18. හරස්බැද්ද ... ... | 123 43... | 103 66... | 90 84... | 69 46... | 63 05... | 67 33... | 101 52... | 82 29... | 90 84... | 66 05... | 90 84... | 69 46... | 29 39... | 82 29... | 78 01... | 123 43... | 97 25 |
| 19. වතුමුල්ල ... ... | | | | | | | | | | | | | | | | | |
| 20. කුඹල්ගමුව ... ... | | | | | | | | | | | | | | | | | |
| 21. දිඹුල ... ... ... | | | | | | | | | | | | | | | | | |
| 22. වටගොඩ ... ... | | | | | | | | | | | | | | | | | |
| 23. තලවකැලේ ... ... | 119 73... | 100 55... | 88 11... | 67 38... | 61 16... | 65 31... | 98 48... | 79 82... | 88 11... | 64 07... | 88 11... | 67 38... | 28 51... | 79 82... | 75 67... | 119 73... | 94 33 |
| 24. ලිඳුල ... ... ... | | | | | | | | | | | | | | | | | |
| 25. වලහ ... ... | | | | | | | | | | | | | | | | | |
| 26. කොටගල ... ... | | | | | | | | | | | | | | | | | |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

A 2

## උපලේඛනය "බී"

### සිල්ලර වශයෙන් විකිණීමේදී ශුඩ බර රාත්තලක වැඩිම මිළ

| 1 තීරය | 2 කෝර | 3 කට්ටා | 4 අන්ජීලා | 5 පරවු | 6 කොඩුවා | 7 බලයා | 8 තොන්ඩන් | 9 කුම්බලාව | 10 බොම්බිලි | 11 හැල්මැස්සෝ | 12 ලෙලි රහිත වියලි ඉස්සෝ | 13 ලෙලි සහිත වියලි ඉස්සෝ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නුවරඑළිය නාගරික සභා ප්‍රදේශය ... | | | | | | | | | | | | |
| 2. නානුඔය ... ... ... | | | | | | | | | | | | |
| 3. කඳපොල ... ... | | | | | | | | | | | | |
| 4. රාගල ... ... ... | | | | | | | | | | | | |
| 5. උඩපුස්සැල්ලාව ... ... | | | | | | | | | | | | |
| 6. රම්බොඩ වවුම ... ... | | | | | | | | | | | | |
| 7. සංගිලිපාලම ... ... | | | | | | | | | | | | |
| 8. කුඩාඔය ... ... ... | | | | | | | | | | | | |
| 9. පුන්ඩළුඔය ... ... | | | | | | | | | | | | |
| 10. තිස්පනේ කෝරලේ ... ... | | | | | | | | | | | | |
| 11. පල්ලෙපනේ කෝරලේ ... ... | 1·29 ... | 0·91 ... | 0·73 ... | 1·05 ... | 0·89 ... | 1·0 ... | 0·73 ... | 0·31 ... | 0·94 ... | 0·89 ... | 1·15 ... | 0·89 |
| 12. මෝරපේ ... ... ... | | | | | | | | | | | | |
| 13. ටිලිකුල්ට්රි ... ... | | | | | | | | | | | | |
| 14. දියගම ... ... ... | | | | | | | | | | | | |
| 15. ආගරපතන ... ... | | | | | | | | | | | | |
| 16. මැදපනේ ගම්කායාසභා ප්‍රදේශය ... | | | | | | | | | | | | |
| 17. දිඹුල ... ... ... | | | | | | | | | | | | |
| 18. වටගොඩ ... ... ... | | | | | | | | | | | | |
| 19. තලවකැලේ ... ... | | | | | | | | | | | | |
| 20. ලිඳුල ... ... ... | | | | | | | | | | | | |
| 21. වලහ ... ... ... | | | | | | | | | | | | |
| 22. කොටගල ... ... ... | | | | | | | | | | | | |
| 23. අඹේවෙල ... ... ... | | | | | | | | | | | | |
| 24. නිල්දණ්ඩාහින්න ... ... | | | | | | | | | | | | |
| 25. හරස්බැද්ද ... ... ... | 1·33 ... | 0·94 ... | 0·76 ... | 1·08 ... | 0·92 ... | 1·03 ... | 0·76 ... | 0·32 ... | 0·97 ... | 0·92 ... | 1·19 ... | 0·92 |
| 26. වතුමුල්ල ... ... ... | | | | | | | | | | | | |
| 27. කුඹල්ගමුව ... ... | | | | | | | | | | | | |
| 28. රූපහ ... ... ... | 1·34 ... | 0·95 ... | 0·77 ... | 1·09 ... | 0·93 ... | 1·04 ... | 0·77 ... | 0·33 ... | 0·98 ... | 0·93 ... | 1·20 ... | 0·93 |

(The price shown for item 11 applies to items 1–22, and the price shown for item 25 applies to items 23–27.)

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.